# 10. ජේසුස් වහන්සේගේ බෞතිස්මය

ජුදයේ බෙත්ලෙහෙම් නුවර උපත ලත් ජේසු බිළිඳු ඇති දැඩි වූයේ ගලීලයේ නාසරෙත් නුවර ය. ජේසු කුමරාට අවුරුදු දොළහ සම්පූර්ණ වනතෙක් ජුදෙව් ආගමික පිළිවෙත්වලට අනුකූල ව දේව ගරුබිය ඇතිව, සිය මව්පියන්ගේ සෙවණෙහි හැදුණු වැඩුණු බව සඳහන් වේ

ජේසුස් වහන්සේගේ වයස අවුරුදු තිහ සම්පූර්ණ වූ විට, තමන්වහන්සේට නියම වූ මෙහෙවරට සූදානම් වීම සඳහා, නාසරෙත් නුවරින් පිටත් වී, ජුදයේ ජෝර්දාන් ගංතෙර කරා සේන්දු වූ සේක.




## ජෝර්දාන් ගංතෙර හි සිදු වූයේ කුමක් ද?

එදින මහා ජනකායක් ජෝර්දාන් ගංතෙර හි පෙළ ගැසී සිටිය හ. ජොහාන් නම් ලත් පුද්ගලයකු මේ ජනතාව අතර සුවිශේෂ කාර්යයක යෙදී සිටියේ ය. මොහු එළිසබෙත් හා පූජක සෙකරියස්ගේ පුත්‍රයා ය. ජොහාන් මෙහි දී දෙවියන් වහන්සේ ඔහුට භාර දුන් කාර්යය සිදු කරමින් සිටියේ ය.

ඔහුගේ කාර්යය නම් ජේසුස් වහන්සේ පිළිගෙන, අදහා ගැනීමට ජනතාවගේ හදවත් සූදානම් කිරීම ය. ඒ සඳහා ජොහාන්තුමා ජනතාවගේ අයහපත් ගති පැවතුම් පෙන්වා දෙමින් ඒවා වෙනස් කරගෙන, නව ජීවිත පැවැත්මකට ඇතුලු වීමට ඉතා ප්‍රබල ලෙස අනුශාසනා කළේ ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

එයට කීකරු වූ ජනතාව **නව උපතක ජීවිතය,** සංකේතවත් කරමින් ජොර්දාන් ගංගාවෙහි ගිල්වීමෙන් බෞතිස්මය ලැබූහ. ජොහාන් තුමා අතින් සිදු වූ මෙම පිළිවෙත බෞතීස්මය ස්නාපනය ලෙස හැඳින්වෙයි. .තමා කළ සේවය අනුව එතුමාට "ස්නාවක ජොහාන්" යන නාමය ව්‍යවහාර විය. ජොහාන්තුමා දුන් මෙම බෞතීස්මයෙන් අවධාරණය වනුයේ පසුතැවිල්ලෙන් නව ජීවිතයකට පා තැබීම යි.



10:1 රූපය
ස්නාවක ජොහාන්තුමා ජනතාවට අනුශාසනා කරමින්

ජුදෙව් සමාජයේ සමහර ජනකොටස් තුළ යහපත් දිවි පැවැත්ම තුරන් වී තිබුණු වකවානුවක, ජොහාන්තුමා මොර ගසමින් දුන් ආරාධනයට යහපත් ප්‍රතිචාර ලැබුණි.

මෙම ජොර්දාන් ගංතෙර කරා ආ ජේසුස් වහන්සේ ද එකතු වූයේ පසුතැවී බෞතීස්මය ලබමින් සිටි ජන කොටසකට ය. මෙමගින් ජේසුස් වහන්සේ ස්නාවක ජොහාන්තුමා තමාගේ සේවය වෙනුවෙන් ගත් පියවර අගය කළ සේක.

ජේසුස් වහන්සේ ස්නාවක ජොහාන් තුමා අතින් බෞතීස්මය ලබා තමාගේ මිහිපිට සේවයෙහි මුල් ම පියවරට පා තැබූ සේක. උන්වහන්සේට පසුතැවිලි වීමක් හෝ පවිත්‍ර වීමක් අවශ්‍ය නොවූවද ජනතාවගේ ජීවිත තුළ නවතාවයක් අත්දැකීමට ඔවුන් තුළ මනස්ථාපනය වීමක් ඇති විය යුතු බව අනුමත කළ සේක .

## ජේසුස් වහන්සේගේ බෞතීස්මයේ දී සිදු වූ දේ ශුද්ධ බයිබලයෙන්

**"ජොහාන් විසින් බෞතීස්ම ස්නාපනය කරනු ලැබූ සේක. උන්වහන්සේ දියෙන් ගොඩ නැගෙත් ම, ස්වර්ගය විවර වී ආත්මයාණන් වහන්සේ පරවියකු මෙන් තමන් පිට බැස එනු දුටු සේක. තව ද ස්වර්ගයෙන් නික්මුණු හඬක්, "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි" පැවසී ය.**

**ශු. මාර්ක් 1 ඃ 10-11**



10:2 රූපය - ජේසුස් වහන්සේගේ බෞතිස්මය

ජේසුස් වහන්සේගේ මිහිපිට සේවය ආරම්භ කිරීමට පෙර, සිදු වූ මෙම සිදුවීම මගින් අවධාරණය කරණු ලැබුවේ,

- උන්වහන්සේ, ප්‍රේමණීය දේව පුත්‍රයා බවත්
- උන්වහන්සේ ගත් ක්‍රියා මාර්ගයට පියාණන් වහන්සේ ප්‍රසන්න වූ බවත්
- ශුද්ධාත්මයාණන් වහන්සේ එම අවස්ථාවේ වැඩ සිටි බවත් ය.

ජේසුස් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ ව මිහිපිට තමාගේ සේවය, පියාණන් වහන්සේගේ කැමැත්තට යටත් ව පුත්‍රයාණන් ලෙස සම්පූර්ණ කළ සේක. මෙසේ ජේසුස් වහන්සේගේ බෞතීස්මය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩ සිටි අයුරු පැහැදිලි වේ.

**කටපාඩම් කරමු.**
**ගලාති 3 : 27**

ක්‍රියාකාරකම

(1) පහත සඳහන් වාක්‍යය ඔබගේ සටහන් පොතේ පිටපත් කොට යා කරන්න

| | |
|---|---|
| 1. ජොර්දාන් නදියේ දී | 1. ජොහාන්තුමාගේ සේවය විය. |
| 2. ක්‍රිස්තු බෞතීස්මයේ දී පරවියා | 2. ජේසුස් වහන්සේ ය. |
| 3. ජනතා හදවත් පවිත්‍ර කිරීම | 3. බැතිමතුන් සවිය ලබත් |
| 4. දෙවිඳුන්ගේ ප්‍රියාදර පුත්‍රයා | 4. ජලයේ ගිල්වා බෞතීස්මය සිදු විය. |
| 5. ශුද්ධාත්ම බලයෙන් | 5. ශුද්ධාත්මය සංකේතවත් විය. |

(2.) ස්නාවක ජොහාන්තුමාගේ මෙහෙවර තුළ ජේසුස් වහන්සේ පිළිගැනීමට ජනතා සිත් සූදානම් කළේ කෙසේ ද? කරුණු දෙකක් ලියන්න.